# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,723/7 — 1966 දෙසැම්බර් 1 වැනි බ්‍රහස්පතින්ද — 1966.12.1

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 6/66 දරන අපනයන පාලන දැන්වීම

නැපැලෙන් බඩු අපනයනය කිරීම

1963 මැයි 3 දින අංක 4/63 දරන අපනයන පාලන දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

1. නිර්ව්‍යාජ ත්‍යාග

(අ) ඉන්දියාවට හැර අනිකුත් රටවලට යැවෙන ලංකාවේ නිෂ්පාදනය හෝ නිමැවීම් කළා වූද වටිනාකම රුපියල් 50 නොවැඩි වූද බඩු අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ලත් බලපත්‍රයක් නොමැතිව යැවිය හැක. මේ බඩු සඳහා කොයි හැටි වුවද, එම බඩුවල වටිනාකම රුපියල් 10 වැඩි නම් විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

(ආ) ඉහත (අ) හි සඳහන් බඩු හැර වෙනත් බඩු සඳහා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් අවශ්‍යය, එම බඩුවල වටිනාකම රුපියල් 10 වැඩි නම් විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන්ද ලත් බලපත්‍රයක් අවශ්‍යය.

(ඇ) සහල් සහ පිටි, මැණික් ගල්, රිදී, රත්තරන්, ප්ලැටිනම් භාණ්ඩ සඳහා අපනයන සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවලින් බලපත්‍රයන් අවශ්‍යය.

(ඈ) වටිනාකම කෙසේ වුවත්, ඉන්දියාවට යැවෙන සියළුම නිර්ව්‍යාජ ත්‍යාග සඳහා බලපත්‍රයක් අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුය.

2. වාණිජ සැම්පල

(අ) ඉන්දියාවට හැර අනෙකුත් රටවලට යැවෙන ලංකාවේ නිෂ්පාදනය හෝ නිමැවීම් කළා වූද වටිනාකම රුපියල් 50 නොවැඩි වූද සහල් සහ පිටි, මැණික් ගල්, රිදී, රත්තරන් සහ ප්ලැටිනම් භාණ්ඩ අන්තර්ගත නොවන්නා වූද බඩු අපනයනය සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවලින් ලත් බලපත්‍රයක් නොමැතිව යැවිය හැක.

(ආ) ඉහත (අ) හි සඳහන් බඩු හැර වෙනයම් බඩු හෝ සහල් සහ පිටි, මැණික් ගල්, රිදී, රත්තරන්, ප්ලැටිනම් භාණ්ඩ සඳහා අපනයන සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවලින් ලත් බලපත්‍රයක් අවශ්‍යය.

(ඇ) වටිනාකම කෙසේ වුවත්, ඉන්දියාවට යැවෙන සියළුම වාණිජ සැම්පල වෙනුවෙන් බලපත්‍රයක් අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුය.

3. මෙරට මුද්‍රිත ප්‍රකාශන

ඉන්දියාවට හැර වෙන රටකට වාර්ෂික සඟරා සහ පත්‍රිකා බඳු මෙරට මුද්‍රිත ප්‍රකාශන අපනයනය කිරීම සඳහා බලපත්‍ර අවශ්‍ය නැත.

4. ප්‍රතිසංස්කරණය කොට ආපසු එවීම සඳහා යවනා නිමැවූ භාණ්ඩ

ඉන්දියාවට හැර වෙන රටකට යවන ප්‍රතිසංස්කරණය කොට ආපසු එවීම සඳහා වූ රුපියල් 100 දක්වා වටිනා නිමැවූ භාණ්ඩ අපනයනය කිරීම සඳහා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ලත් බලපත්‍ර අවශ්‍ය නැති නමුදු, විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

5. ප්‍රොසෙස් කිරීම, ඩිවෙලොප් කිරීම සහ මුද්‍රණය කිරීම සඳහා යවනා ඡායාරූප පටල

ප්‍රොසෙස් කර, ඩිවෙලොප් කර, මුද්‍රණය කර ආපසු එවීම සඳහා වූ ඡායාරූප පටල අපනයනය කිරීමට විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් ලත් බලපත්‍ර අවශ්‍ය නැති නමුදු, අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

986/41——ආර් ආර් 19468—12,300 (66/12)

**6. විවිධ විෂයවල්**

ඉන්දියාවට හැර වෙන රටකට පහත දැක්වෙන විෂයයන් අපනයනය කිරීම සඳහා අපනයන පාලක සහ විනිමය පාලක දෙපාර්තමේන්තුවලින් ලත් බලපත්‍ර අවශ්‍ය නැත:—

(අ) **ශිෂ්‍යම් කිරීමේ පරමාර්ථයෙන් පිටරට යවන ශිෂ්‍යම් පොත්,**
(ආ) විභාග කිරීම සහ පරීක්ෂණ කිරීම පිණිස පිටරට යවන වටිනාකම රුපියල් 50 දක්වා වූ සැම්පල,
(ඇ) හරි වැරදි බැලීම යනාදිය සඳහා පිටරට යවන උත්තර පත්‍ර සහ (ටියුටෝරියල්) ගුරුකුල පාඩම්,
(ඈ) වටිනාකම රුපියල් 50 දක්වා වන නිර්ව්‍යාජ විද්‍යාත්මක ආදර්ශ,
(ඉ) නිර්ව්‍යාජ සංචාරකයින්, මගීන් හා විදේශ වෙළඳ සංචාරකයින් විසින් යවනු ලබන රුපියල් 50 දක්වා වූ ශබ්ද කවන ලද ටේප්, වයර්, තැටි හා සමාන උපකරණ.

**7. සංචාරකයින්, සංක්‍රමණ මගීන් හෝ නැව්වල නාවුක පිරිස් විසින් බඩු අපනයනය කිරීම**

සංචාරකයින්, සංක්‍රමණ මගීන් සහ නැව්වල නාවුක පිරිස් තම තමන් විසින් ගෙන එනු ලබන මුදල් හදල්වලින් ගොඩදී මිළට ගනු ලබන ලංකාවේ නිෂ්පාදිත හෝ නිමවන ලද බඩු අපනයනය සඳහා ඉදින් යථෝක්ත මිළ මුදල් ඔවුන්ගේ සපැමිණීමත් සමගම රේගුවට ප්‍රකාශ කරනු ලැබ එහිලා වූ ලේඛනාත්මක සාක්ෂි තැපැල් බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදුව ඇතොත් අපනයනය සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවලින් ලත් බලපත්‍ර අවශ්‍ය නැත. ඒ කොයි හැටි නමුදු, ආභරණ සහ මැණික් ගල්, රිදී හෝ රත්තරන් හෝ ප්ලැටිනම් භාණ්ඩ අපනයනය සඳහා අපනයන සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවලින් ලත් බලපත්‍රයක් අවශ්‍යය.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

එස්. ඊ. පී. ජැන්ස්,
විනිමය පාලක.

කොළඹ 1, 1966 දෙසැම්බර් 1 වැනිදා.